# සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

## නිවාඩු කාලීන පැවරුම 12 - බුද්ධ ධර්මය - 4 ශ්‍රේණිය

සැකසුම - එම්.වී.සම්පත් බන්ධු ගුණසේකර - ර/බළ/වෙළගපොළ විද්‍යාලය

### වාචික කොටස

1. ගේ දොර පිළිවෙළකට තබා ගැනීමෙන් අපට ලැබෙන වාසි තුනක් කියන්න.
2. ගේ දොර පිළිවෙළකට තබා ගැනීමට අපට කළ හැකි දේවල් තුනක් කියන්න.
3. ඕකාස අහං භන්තේ තිසරණේන සද්ධිං යන ගාථාව කියන්න.
4. පාසල් සිසුවෙකු සතු හොඳ ගුණාංග මොනවාද?
5. මෛත්‍රී භාවනාවට සූදානම් වන අයුරු විස්තර කරන්න.
6. අනුග්‍රහ බුද්ධියෙන් දන් දිය හැකි අවස්ථා පහක් කියන්න.
7. පරිසරය අලංකරණයට ඔබට කළ හැකි දේ කියන්න.
8. පිරිත් මණ්ඩපය සාදන ආකාරය විස්තර කරන්න.
9. පිරිත් මණ්ඩපය ඇතුළත තැන්පත් කරන දේ මොනවාද?
10. අපේ සිත අපිරිසිදු වූ විට සිදුවන දේ මොනවාද?

### ලිඛිත කොටස

- පහත සඳහන් වැකි හරි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද වරහන් තුළ යොදන්න.

1. පිරිත් මණ්ඩපය තුළ සංඝ රත්නය සංකේතවත් වන්නේ ධාතු කරඬුවෙනි ( )
2. හොඳ මිතුරන් සැමවිටම අපව විපතට පත් කරයි. ( )
3. මහප්‍රජාපතී ගෝතමී දේවියගේ පුතා ආනන්ද විය. ( )
4. යේ ධම්මා හේතුප්පභවා යන ගාථාවේ පද දෙකක් ඇසූ පමණින් ම උපතිස්ස පිරිවැජී රහත් විය. ( )
5. උපන් දිනයට සාදයක් පැවැත්වීම යහපත් බොදු සිරිතකි. ( )

- හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. පිරිත් නූල් බඳිනු ලබන්නේ ................................. අතේය. (වම්/දකුණු)
2. බුදු හාමුදුරුවො අපිත් දකින්නැති ගීතය ගායනා කරන්නේ .............. මහතාය. (සුනිල් එදිරිසිංහ / වික්ටර් රත්නායක)
3. කාන්තාවන්ට බුදු සසුනේ පැවිද්ද හිමි වූයේ ................ දී ය. (නිග්‍රෝධාරාමයේ/කූටාගාර ශාලාවේ)
4. විහාරස්ථානයේ දී මුලින්ම වන්දනා කළයුතු වන්නේ ................ ය. (බෝධි මළුව/සෑ මළුව)
5. ප්‍රමාණවත් තරම් ආහාර බෙදා ගැනීම ................. පුරුද්දකි. (යහපත් / අයහපත් )